# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

METH SAVIYA NEWS LETTER

සාමජිකයන් සඳහා තොරතුරු පත්‍රිකාව ✶ 2011 නොවැම්බර් ✶ මෙත්සවිය අටවන කාණ්ඩය ✶ 17 වන කලාපය



නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙන් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා

මෙත් සවිය ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ 06.

දුරකතන : 071 4014467 / 011 2505088 වෙබ් අඩවිය : www.methsaviya.lk විද්‍යුත් තැපැල : methoffice@gmail.com

## 2600 සම්මා සම්බුද්ධත්ව ජයන්තිය සමරනු වස් මෙත් සවිය ප්‍රධාන වැඩසටහන ලෙස බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදුවූ මහියංගනය පුණ්‍ය භූමියේ කරනු ලබන පිංකම් මාලාව

අප ගෞතම බුදුරජාණන්වහන්සේ දැනට වසර 2600කට පෙර එනම් බුද්ධත්වයෙන් නව මසක් ඇවෑමෙන්වූ දුරුතු පුන්පොහෝ දින ශ්‍රී ලංකාවේ පළමුවරට ශ්‍රී පාද පද්ම ස්පර්ශයෙන් පවිත්‍ර කල, මහියංගනයේ යක්ෂ ගෝත්‍රිකයන් දමනය කර දහම් දෙසූ ස්ථානය වන, බුදුරජාණන් වහන්සේගේ කේෂ ධාතූන් වහන්සේලා නිදන් කර මහියංගන චෛත්‍යය ඉදිකර ඇති පින්බිමෙහි සම්මා සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් මෙත් සවිය මගින් කලක් පවත්නා විශේෂ අරමුණු කිහිපයක් ඉටු කරන්නට අපේක්ෂා කර ඇත.

1. මහියංගනය වැඳ පුදා ගැනීමට එන ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් සඳහා වන පානීය ජලය සැපයීමේ ව්‍යාපෘතිය - ( රු. 400,000 වැඩි වියදමක් දරා දැනටමත් නිම කර ඇත)
2. අඩි 84ක් උස බුදු පිළිමය තැනීම- මූලික ගවේශන/පාංශු පරීක්ෂණ කටයුතු දැනටමත් අවසන් කර ඇත.

2012 ජනවාරි 08 දුරුතු පොහොය දින පෙ.ව. 9:00 -මහියංගන පින්බිමෙහි මෙත්සවිය තනවන අඩි 84ක් උස බුදු පිළිමය සඳහා සුභ මොහොතින් මංගල පස් පිඬ කපා මෙම බුදු පිළිමයේ ආකෘතියක් පෙරහරින් වැඩමවා බුදු පිළිමය තනවන ස්ථානයේ පිහිටුවා ඉදි කිරීමේ ආරම්භය සනිටුහන් කිරීමට කටයුතු යොදා ඇත. එදින එම පුද බිමෙහි තවත් පින්කම් රැසක් වෙනත් සංවිධාන සැලසුම්කර ඇති බැවින් නිදහසේ වැඳ පුදාගැනීම අපහසු නිසා එක බස් රියක් පමණක් ජනවාරි 07 සෙනසුරාදා පෙ.ව. 7:00ට වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයෙන් පිටත් වේ. ආකෘතිය පිහිටුවා ජනවාරි 08 දහවල් 12:00ට ආපසු පිටත්වීමට සැලසුම් කර ඇත. ලක්ෂයක පමණ බැතිමතුන් මේ දිනයේ පැමිණෙන නිසා පහසුකම් අවම වේ. එක් අයෙකුට ආහාර පානද සහිතව බරපැණ රු. 4000කි. ජල
ව්‍යපෘතියට හා බුදු පිළිමයට ආධාර කල අයට ප්‍රමුඛතාව හිමිවේ. කාර්යාලය අමතා ආසන වෙන්කරගත හැකිය. පවුලේ සාමාජිකයන්ටද පැමිණිය හැක. එදිනට සිල් සමාදන්වීම සඳහා සුදු වතින් සැරසී පැමිණෙන්න.

බුදු පිළිමය තනවා නිරාවරණය කිරීමේ උත්සවය අගෝස්තු මාසයේ පමණ සඳහා මෙත් සවිය සියලු සාමාජික සාමාජිකාවන් කැඳවා ගෙන යාමට බලාපොරොත්තු වේ. මේ සඳහා පහත දැක්වෙන ආධාර දැනටමත් ලැබී ඇත.

1. විපුලතේජ විශ්වනාත් අපොන්සු මහතා (පළමු ලේකම්- ශ්‍රී ලංකා තානාපති කාර්යාලය- සෞදි අරාබිය) රු. 100,000.
2. සරත් ඉලංගතිලක මහතා හා එම මැතිණිය වන අසේලා කුරුප්පු ආරච්චි මිය. රු. 500,000 හා පිළිම ශීර්ෂයේ ධාතු නිධන් කිරීමට කරඬුවක් තැනීමට රත් රන් බිස්කට්3ක්.
3. කැළණිය කරුණාදාස රත්නායක මහතා හා එම මැතිණිය වන ඒ.ආර්. ඉන්ද්‍රානි මිය. ඇතුළු රත්නායක පවුලේ සැම රු. 125,000
4. රංජිත් සොයිසා මහතා හා එම මැතිණිය පිළිම ශීර්ෂයේ ධාතු නිධන් කිරීමට කරඬුවක් තැනීමට රත් රන් බිස්කට්1ක්.

මෙම කාර්යය නිම කිරීමට ඔබ සැමගේ දායකත්වය හැකි අයුරින් ලබාදී කුසල් රැස් කරගන්න.



# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී විජයාරාමය, පෙඩ්‍රිකා පාර, කොළඹ - 06.

## අප ගැන වචනයක්...

මෙත්සවිය සංසදය නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රීලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි. සංසදය විසින් පවත්වන සාර්ථකව ඉගෙන ගන්නා අයුරු හා විභාග සමත්වන අයුරු, කාල කළමනාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනාව වැනි වැඩසටහන් සඳහා සහභාගීවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයන්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීමට තෙමසකට වරක් දන-සිල භාවනා වැඩසටහන් පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙරපානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම, මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

### මෙත්සවිය විධායක කමිටුව

**2011**

**ගරු අනුශාසක**
ශ්‍රී විනයචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත
වංසාලංකාර අමරපුර නිකායේ
අධිකරණ සංඝනායක
අතිපූජ්‍ය අහංගම ආනන්ද
මහා ස්ථවිරයන් වහන්සේ

**ගරු සභාපති**
විද්‍යා කීර්ති, ශාසනදීපන,
ලෝකාර්ථචාරී,
විද්‍යාවාචස්පති, දේශමාන්‍ය,
විශ්ව විද්‍යා අධිමනෝවිද්‍යාවේදී,
නාලන්දා කීර්ති ශ්‍රී
ආචාර්ය චන්දන ජයරත්න මහතා

**ගරු උප සභාපතිවරු**
සරත් ඉලංගතිලක මහතා
නිහාල් මෙන්ඩිස් මහතා

**ගරු සම ලේකම්වරු**
තුසිත දොඹගොඩ මහතා
පී. සූරියආරච්චි මහතා

**ගරු භාණ්ඩාගාරික**
වාසනා රණසිංහ මහතා

**ගරු උප භාණ්ඩාගාරික**
ජනක සුවඳරත්න මහතා

**ගරු සංස්කාරක**
එස්. කේ. කළුබෝවිල මහතා

**ගරු වෙබ් කළමනාකරු**
සංජීව රත්නායක මහතා

**ගරු කාරක සභිකවරු**
නාලක එදිරිසිංහ මහතා
රංජිත් සොයිසා මහතා
එස්. පී. පියරත්න මහතා
එම්.කේ. ප්‍රියන්ත මහතා
අසංක රත්නායක මහතා
සහන් මොරවක මහතා

## සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

2012 ජනවාරි 01-වසරේ ප්‍රථම හීල් දානමය පින් කමට සහභාගි වීමට කැමති මෙත්සවිය සාමාජිකයන් පෙ.ව. 06.00ට පෙර කොළඹ 02 හුණුපිටිය ගංගාරාම විහාරයට පැමිණිය යුතුය. පෙ.ව. 06.30 ට කේශ ධාතූන්වහන්සේ වෙත බුද්ධ පූජාව හා පෙ.ව. 07.00 මහා සංඝරත්නයට හීල් දානය පිළිගැන්වේ.

කිරිබත්, ලුණු මිරිස්, ආප්ප, ඉඳිආප්ප, පරිප්පු හොදි, අල හොදි, සීනි සම්බෝල, මුංඇට, කඩල, පලතුරු, කැවිලි, පිරිකර ආදී ද්‍රව්‍ය කැමති අයට ගෙනවිත් පූජාවට තැබිය හැකිය. විස්තර ගරු ලේකම් තුසිත දොඹගොඩ මහතාගෙන් (දුරකතනය 0714454411) හෝ කාන්තා කමිටු ගරු සභාපති නන්දනී වික්‍රමසූරිය මහත්මියගෙන් (දුරකතනය 011 282 4900) ලබාගත හැකිය.

2012 ජනවාරි 01- පෙ.ව. 11.00ට කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ සරණ ළමා නිවාසයේ ළමයින්ට දහවල් ආහාරය සහ අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම ආචාර්ය චන්දන ජයරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරේ. කැමති මෙත් සවිය සාමාජිකයන්ට සහභාගි විය හැකිය.

2011 ජනවාරි 01 මාසික පලමු ඉරු දින ධර්ම දේශනය කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ ම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේදී ප.ව. 2:00 පැවැත්වේ. මෙත්සවිය 2012 දින දර්ශනය එදිනට ලබාගත හැක.

2012 ජනවාරි 08 දුරුතු පොහොය දින පෙ.ව. 9:00 -මහියංගන පින්බිමෙහි මෙත්සවිය තනවන අඩි 84ක් උස බුදු පිළිමය සඳහා මංගල පස් පිඬ කපා බුදු පිළිමයේ ආකෘතියක් පිහිටුවීම.- මෙයට සහභාගි වීමට කැමති අය බස් රියේ ආසන වෙන්කර ගැනීමට පිළිබද විස්තර 2වන පිටෙහි සඳහන් කර ඇත.

2012 ජනවාරි 15 ඉරු දින ප.ව.2:00 - 23 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන ආරම්භ වේ. ඉල්ලුම්පත් බාරගැනීමේ අවසාන දිනය දෙසැම්බර්17. මේ සඳහා සහභාගි වීමට බලාපොරොත්තු වන සාමාජිකත්වය අලුත් කරගත් සාමාජිකයින්ට 2011.12.30 දිනට ප්‍රථම ඒ බව කාර්යාලයට ලිඛිතව දන්වන්න.

2012 ජනවාරි 15 ඉරු දින පෙ.ව.10:00ට අධි මානසික විද්‍යා හා පංච අභිඥා වැඩමුලුව_ආරම්භ කිරීමට නියමිතය. ඉල්ලුම් පත් 2012 ජනවාරි 01 දක්වා භාර ගැනේ.

2012 පෙබරවාරි 05 ඉරු දින- මෛත්‍රී භූෂණ උපහාර සම්මාන උළෙල සහ මෙත්සවිය වාර්ෂික මහා සභා රැස්වීම. කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේදී ප.ව.2:00ට ආරම්භ වේ. මාසික පලමු ඉරු දින දේශනය ප.ව.3.00ට ටිබෙට් දේශය ගවේශණය කොට මිහිඳු ගිරෙන් හිම ගිරට ග්‍රන්ථය සැකසූ පූජ්‍ය පණ්ඩිත මිස්සක කමලසිරි හිමිගේ තිබ්බතයේ බුදු දහම මැයෙන් රූප දර්ශන ඇතුලත් දේශනය පැවැත්වේ. දේශනය අවසානයේදී 2011 අයවැය ඉදිරිපත් කර නිලධාරී මණ්ඩලය පත්කරගැනීම සිදු කෙරේ. එදින සාකච්ඡාව සඳහා නව යෝජනා ඇතිනම් කාර්යාලයට බාරදෙන්න. එදිනට අනුපමය සේවයක් කර ඇති පුද්ගලයන්ට මෙත්සවිය ගෞරව උපහාර සම්මාන පිරිනැමීමට බලාපොරොත්තු වේ.

## 2012 මාර්තු 04 ඉරු දින - සාර්ථකව ඉගෙනීම හා විභාග සමත් වීමේ නවීන ක්‍රමවේද පිළිබඳ වැඩමුළුව

මෙදින මාසික රැස්වීම වෙනුවට වසරකට වරක් ආචාර්ය චන්දන ජයරත්න මහතා මෙත්සවිය සංසදයේ සාමාජිකයින් හා ඔවුන්ගේ දරුවන් සඳහා නොමිලයේ පවත්වන මෙම වැඩමුළුවට ඉරිදා ප.ව.1:00 සිට 5:00 දක්වා බොරැල්ල තරුණ බෞද්ධ සංගම් ශාලාවේදී (බොරැල්ල YMBA) සහභාගි විය හැකිය. සාමාජිකයා සමඟ පැමිණෙන විට (ලමුන් තනිව පැමිණෙන්නේ නම් උප්පැන්නයේ පිටපතක් හා සාමාජිකයාගේ ලිපියක් රැගෙන ආවිට) සාමාජිකයාගේ ලමුන්ට නොමිලයේ සහභාගි විය හැකිය. එක් සාමාජිකයෙකුට එක මුද්‍රිත සටහනක් පමණක් සැපයේ.

සාමාජික නොවන සිසු සිසුවියන්ට හා වෙනත් වැඩිහිටි අයටද සහභාගි විය හැකි අතර මුද්‍රිත ද්‍රව්‍ය හා ශාලා ගාස්තු සඳහා යන බරපැන පියවීම සඳහා එක් අයෙකුට රු 500/= මුදලක් එදිනදී ආයෝජනය කලයුතු වේ.

මේ සඳහා 2012-02-29 දිනට පෙර 071-4014467 හෝ 011-2505088 අමතා ලියා පදිංචි වන්න.

වයස 12ට වැඩි ඕනෑම අයෙකුට සහභාගි වී පාඩම් කිරීමේ නවීන ක්‍රම, වේගයෙන් ලිවීමේ කියවීමේ නවීන ක්‍රමවේද, ඉගෙනීමට බාධාවන මානසික රෝගහඳුනාගැනීම, මතකය වර්ධනය සඳහා ක්‍රියාමාර්ග, බුද්ධි වර්ධන අභ්‍යාස, කාලසටහන් තැනීම, ස්වයං යෝජනා ක්‍රම හා විභාගයකදී සමත්වීමට පිළිතුරු ලියන පිළිවෙල ආදී වැදගත් කරුණු රාශියක් දැනගත හැකිය. මිනිසා විසින් උපතේ සිට මරණය දක්වාම නොකඩවා සිදුකරන ක්‍රියාවලියක් වන ඉගෙනීම නිසි පරිදි සිදු කරන අයුරු පැහැදිලි කරන මෙම වැඩමුළුව ළමා හා වැඩිහිටි සියලු දෙනාටම වැදගත්ය.

සාමාජික කණ්ඩායම් අංක 01 සිට 20 දක්වා මීට ඉහත මෙම වැඩ සටහනට සහභාගි වී ඇති සාමාජිකයින් ඔවුන් වෙත ඇති මුද්‍රිත සටහන් රැගෙන එන්නේ කෘතඥ වෙමු.

## මාසික පළමු ඉරු දින රැස්වීම

සෑම මසකම පළමුවෙනි ඉරු දින සිරිත් පරිදි (දාන සීල භාවනා වැඩ සටහන් සඳහා සදහම් චාරිකාවේ නොයෙදෙන දිනවලදී) මාසික රැස්වීම් සහ විශේෂ දේශනය ප.ව. 2:00 - 4:00 දක්වා කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේදී පැවැත්වේ. එහෙයින් දැන්වීමක් ලැබුනද නොලැබුනද සෑම මසකම පළමුවෙනි ඉරු දින (සදහම් චාරිකාවේ යෙදෙන දිනවලදී හැර) මාසික රැස්වීම සඳහා ප.ව. 2:00ට පෙර පැමිණෙන ලෙස සියලු සාමාජික සාමාජිකාවන්ගෙන් මෙත් සිත්පෙරදැරිව ඉල්ලා සිටින්නෙමු. ඉදිරි වැඩ සටහන් පිළිබඳ විස්තර www.methsaviya.lk වෙබ් අඩවියෙන්ද දැන ගත හැකිය. මෙම වැඩ සටහනට දිවයිනේ සුපතල ධර්ම දේශක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වැඩම කරවීම හෝ පෞරුෂ වර්ධනය, යෝග ආදී විශේෂිත කරුණක් හඳුන්වාදීම සඳහා ගිහි භවතකු හට හෝ ආරාධනා කරනු ලැබේ. මේ සඳහා සාමාජිකයින් යෝජනා ඇතොත් සභාපති/ලේකම් වෙත දන්වන්න.

## සාමාජිකත්වය අලුත් කිරීම

සාමාජික පත්‍රයේ සඳහන් සාමාජිකත්වය වලංගු සීමාවේ දිනයට පෙර සාමාජිකත්වය අලුත් කරගැනීමෙන් මෙත්සවිය සවිමත් කර ඉදිරි පුණ්‍ය කටයුතු කරගෙන යාමට දායක වන ලෙස මෙත් සිත් පෙරදැරිව මතක් කරමු. ඒ සඳහා කාර්යාලයට පැමිණීම අත්‍යවශ්‍ය නොවේ. ගෙවිය යුතු රු.500/= සාමාජික ගාස්තුව "මෙත්සවිය" නමට ලියා රේඛනය කල චෙක්පතක් හෝ ගෙවන කාර්යාලය, "වැල්ලවත්ත" ලෙස සටහන් කල "මෙත්සවිය"නමට සාමාන්‍ය මුදල් ඇණවුමක් තම ලිපිනය ලියූ රු.30/=ක මුද්දරකවරයක් හා පැරණි සාමාජිකපතද ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයාරාමය, පෙඩ්‍රිකා පාර, කොළඹ06. ලිපිනයට එවීමෙන් අලුත් සාමාජිකපත ලියාපදිංචි තැපෑලෙන් ලබාගත හැකි බව කාරුණිකව දන්වමු.

## සංසදයේ ලිපි යැවීම සඳහා මුද්දර පරිත්‍යාග

සංසදයේ ලිපි යැවීම සඳහා මුද්දර ගාස්තු ලෙස විශාල මුදලක් වැය කිරීමට සිදුවී ඇත. මෙම සත්කාර්යය සඳහා මුද්දර පරිත්‍යාග කිරීමට කැමති පින්වතුන්ට රු.10 හෝ ඊට වැඩි අගයක මුද්දර කැමති ප්‍රමාණයක් පරිත්‍යාග කල හැකිය. ලබා දෙන මුද්දර ඒ සඳහා ඇති ලේඛනයේ සටහන් කරනු ලැබේ. මෙත් සවිය සංසදයේ පැවැත්මට හා එහි වර්ධනය සඳහා ඔබ ගේ ශාසනාලයැති දායකත්ව අගය කරන්නෙමු.

## මෙත් සවිය ප්ලාස්ටික් හැඳුනුම්පත

ඡායාරූපවලට පෙනී සිට හැඳුනුම්පත ලබා නොගත් වලංගු සාමාජිකත්වය ඇති සාමාජිකයින්ට ඒවා කාර්යාලයෙන් ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිමු.

## මෙත් සවිය නොමිලයේ නීති උපදෙස් සේවය

සාමාජිකයින් සඳහා අවශ්‍ය නීති උපදෙස් කෙටි වශයෙන් දුරකතනයෙන් හෝ මසකට වරක් හමුවී හෝ ලබා දීමට කැමති සාමාජික නීතිඥ මහත්ම මහත්මීන් වෙතොත් සභාපති / ලේකම් වෙත හෝ කාර්යාලයට දන්වන්න.

## සාමාජිකයින් හා සාමාජිකයන්ගේ පවුලේ අය සඳහා නොමිලයේ ඇස් පරීක්ෂාව හා ඇස් කන්නාඩි ලබාදීම

ඉදිරියේදී පැවැත්වීමට නියමිත මෙම වැඩ සටහන සඳහා ඇස් කන්නාඩි / රාමු කිහිපයක් හෝ ලබාදී දායක වීමට කැමති පිංවතුන් වෙතොත් සභාපති /ලේකම් වෙත හෝ කාර්යාලයට දන්වන්න.

## පූජා භූමිවල පානීය ජල ටැංකි සවි කිරීම / පැන් පහසුකම් තැනීමේ ව්‍යාපෘතිය

පූජනීය සිදධස්ථානවල ජල ටැංකි / ජල නල/කරාම, සවිකර දීමේ සද් කාර්යයක් අරඹා ඇත. ඔබගේ නමද සටහන්ව මෙම ජල ටැංකි අනුරාධපුරය වැනි ස්ථානවල පමණක් නොව අවශ්‍ය වෙනත් සිදධස්ථානවල පවා තනා එම ස්ථානවලට එන පිංවතුන්ගේ පවස නිවීමට කැමති සාමාජිකයින් වෙතොත් කැමත්ත සභාපති /ලේකම් වෙත හෝ කාර්යාලයට දන්වන්න. අවශ්‍ය විටදී ඔබව අමතන්නෙමු. මේ සඳහා රු10,000/=- 40,000/= දක්වා (ස්ථානය අනුව වෙනස් වේ.) වියදමක් දැරීමට සිදුවිය හැකිය. තනිව හෝ කිහිපදෙනෙකු එක්වද මේ සඳහා දායක විය හැකිය. පැන් පහසුකම් අවශ්‍ය සුදුසු සිදධස්ථාන වෙතොත් අප වෙත දන්වන්න.

# මහ සතර සිහිවටන

## උදෙස් වර (උද්දේස වාරය)

### කය'නුදක්නාව (කායානුපස්සනා)

1. අස්වස්-පස්වස් පුරුක (ආනාපාන පබ්බ)
2. ඉරියවු පුරුක (ඉරියාපථ පබ්බ)
3. සිවු සපදන් පරුක (චතුසම්පජඤ්ඤ පබ්බ)
4. පිලිකුල් මනසිකර පරුක (පටික්කුල මනසිකාර පබ්බ)
5. දා මනසිකර පුරුක (ධාතු මනසිකාර පබ්බ)
6. නව සොහොන් පුරුක (නව සීවථිකය)

### විඳුම්'නුදක්නාව (වේදනානුපස්සනා)

### සිත'නුදක්නාව (චිත්තානුපස්සනා)

### දහම්'නුදක්නාව (ධම්මානුපස්සනා)

#### පළමු බණ වර (පඨමක භාණ වාර)

1. නිවරන පුරුක (නීවරණ පබ්බ)
2. (උවදන්) කඳු පුරුක (ඛන්ධ පබ්බ)
3. ආයතන පුරුක (ආයතන පබ්බ)
4. බොජඟ පුරුක (බොජ්ඣංග පබ්බ)

#### දුක් සස් නිදෙස (දුක්ඛ සච්ච නිද්දේස)

1. ඉපැදුම (ජාති)
2. දිරා යෑම (ජරා)
3. ලෙඩ (ව්‍යාධි)
4. මරනය (මරණ)
5. සොව (සෝක)
6. වැලැපීම (පරිදේව)
7. (කයැ) දුක (දුක්ඛ)
8. දොම්නස (දෝමනස්ස)
9. උවයස (උපායාස)
10. අපියයන් එක් වීම (අප්පිය සම්පයෝග)
11. පියයන් වෙන් වීම (පියෙහි විප්පයෝග)
12. රිසි දේ නොලැබුම (යම්පිච්ඡං න ලභති)

#### (දුක්) හටගැනුම් සස් නිදෙස (සමුදය සච්ච නිද්දේස)

1. ඇතුළු සය (අජ්ඣත්තිකායතන ඡක්ක)
2. බැහැරි සය (බාහිරායතන ඡක්ක)
3. විනැණ සය (විඤ්ඤාණ ඡක්ක)
4. පහස් සය (ඵස්ස ඡක්ක)
5. විඳුම් සය (වේදනා ඡක්ක)
6. සන් සය (සඤ්ඤා ඡක්ක)
7. සිතුම් සය (චේතනා ඡක්ක)
8. තණ්හා සය (තණ්හා ඡක්ක)
9. විතක් සය (විතක්ක ඡක්ක)
10. විචාර සය (විචාර ඡක්ක)

#### (දුක්) පහවීම් සස් නිදෙස (නිරෝධ සච්ච නිද්දේස)

1. ඇතුළු සය (අජ්ඣත්තිකායතන ඡක්ක)
2. බැහැරි සය (බාහිරායතන ඡක්ක)
3. විනැණ සය (විඤ්ඤාණ ඡක්ක)
4. පහස් සය (ඵස්ස ඡක්ක)
5. විඳුම් සය (වේදනා ඡක්ක)
6. සන් සය (සඤ්ඤා ඡක්ක)
7. සිතුම් සය (චේතනා ඡක්ක)
8. තණ්හා සය (තණ්හා ඡක්ක)
9. විතක් සය (විතක්ක ඡක්ක)
10. විචාර සය (විචාර ඡක්ක)

#### (දුක් නිවන) මං සස් නිදෙස (මග්ග සච්ච නිද්දේස)

1. හරි දිටුව (සම්මා දිට්ඨි)
2. හරි සිතුම (සම්මා සංකප්ප)
3. හරි වදන (සම්මා වාචා)
4. හරි කමත (සම්මා කම්මන්ත)
5. හරි දිවිය (සම්මා ආජීව)
6. හරි වෑයම (සම්මා වායාම)
7. හරි සිහිය (සම්මා සති)
8. හරි සමාදිය (සම්මා සමාධි)

# මහා සංඝරත්නය වන්දනා කිරීම

## පින් අනුමෝදන් කරවීම සහ පින් අනුමෝදන් වීම

| | |
|---|---|
| උපාසක / උපාසිකා : | ඕකාස වන්දාමි භන්තේ<br>මයා කතං පුඤ්ඤං<br>සාමිනා අනුමෝදිතබ්බ |
| භික්ෂූන් වහන්සේ : | සාධු! සාධු! අනුමෝදාමි |
| උපාසක / උපාසිකා : | සාමිනා කතං පුඤ්ඤං<br>මය්හං දාතබ්බං |
| භික්ෂූන් වහන්සේ : | සාධු! සාධු! අනුමෝදාහි |
| උපාසක / උපාසිකා : | සාධු! සාධු! අනුමෝදාමි<br>ඕකාස ද්වාරත්තයේන<br>කතං සබ්බං අච්චයං<br>ඛමථ මේ භන්තේ |
| භික්ෂූන් වහන්සේ : | ඛමාමි ඛමි තබ්බං |
| උපාසක / උපාසිකා : | ඕකාස ඛමාමි භන්තේ |

## භික්ෂූන් වහන්සේලා වන්දනා කරන ගාථා

සීලවන්තං ගුණවන්තං

පුඤ්ඤංඛෙත්තං අනුත්තරං

දුල්ලභේන මයා ලද්ධං

පස්සිතුං වන්දිතුං වරං

සරි පුත්තාදි ථේරානං

ආගතං පටිපාටියා

සද්ධා සීලං දයාවාසං

බුද්ධ පුත්තං නමාමහං

## චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහනට සහභාගි වන සාමාජික පින්වතුන්ට ගිලන් පස -තේ පැන් සැපයීම

2011-05-15 දින සිට මෙම කාර්ය අරඹා කර ගෙන යන්නේ මෙත් සවිය කාන්තා කමිටුව විසිනි. මෙයට දායක වන පින්වතුන්ට සහ එය ඉටු කරන කාන්තා කමිටු සාමාජිකාවන්ට නිවන්දක්නා ජාති දක්වා ආහාරපාන හිගයක් ඇති නොවේවායි පතමු.

## 2600 සම්මා සම්බුද්ධත්ව ජයන්තිය සමරනු වස් මෙත් සවිය මහියංගනය පුණ්‍ය භූමියේ පැන් ව්‍යාපෘතිය

අප ගෞතම බුදුරජාණන් වහන්සේ දුරුතු පුන් පොහෝ දින ශ්‍රී ලංකාවේ පලමුවරට ශ්‍රී පාද පද්ම ස්පර්ශයෙන් පවිත්‍ර කල, මහියංගනයේ යක්ෂ ගෝත්‍රිකයන් දමනය කර දහම් දෙසූ ස්ථානයේ, බුදුරජාණන් වහන්සේගේ කේෂ ධාතු නිදන් කර මහියංගන චෛත්‍යය ඉදිකර ඇති පින්බිමෙහි මෙත් සවිය මගින් රු. 400,000 වැඩි වියදමක් දරා පානීය ජල ව්‍යාපෘතිය නිම කලෙමු. මෙම කාර්යයට මුදලින් දායක වූ පහත සඳහන් සාමාජිකයන්ටත් නන් අයුරින් උදව් කල සියලු දෙනාටත් පින් අනුමෝදන් කරමු.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 14-2501 | රොහාන් ද සිල්වා මයා. | 100,000.00 | 21 | 03-0686 | නිහාල් මෙන්ඩිස් පවුලේ සැම | 2,340.00 |
| 2 | 03-0572 | කුමාරි නාගරනායක මිය. | 100,000.00 | 22 | 20-3212 | ඩී.එල්.පී. රේණුකා ප්‍රියන්ති මිය. | 2,000.00 |
| 3 | | තරුෂි සඳමාලි ගෝමස් මෙය. | 100,000.00 | 23 | 18-2962 | එම්.කේ. ප්‍රියන්ත මයා. | 2,000.00 |
| 4 | 06-1077 | එච්. පියසීලි මිය. | 50,000.00 | 24 | 03-0593 | නාලිනී ධර්මරත්න මිය. | 1,000.00 |
| 5 | | අනුරුද්ධ සිල්වා මයා. | 10,000.00 | 25 | 13-2246 | ඒ.ඩී. ආරියසිංහ මයා. | 1,000.00 |
| 6 | 13-2263 | චිත්‍රා ද සිල්වා මිය. | 10,000.00 | 26 | 01-0289 | බී. චමින්ද මයා. | 1,000.00 |
| 7 | | ප්‍රැන්ක්ලින් බ්‍රොනි අල්මේදා | 6,000.00 | 27 | 16-2694 | තුෂානී විදානපතිරණ මිය. | 1,000.00 |
| 8 | 02-0419 | ස්වර්ණා ගුණසේකර මිය. | 5,000.00 | 28 | 09-1572 | තමරා සමරවීර මිය. | 1,000.00 |
| 9 | 20-3210 | අජන්ත ඩයස් මයා. | 5,000.00 | 29 | 20-3257 | ගංගා රෝහිණී මිය. | 500.00 |
| 10 | 20-3211 | දුනිඳු ඩයස් මයා. | 5,000.00 | 30 | 01-0256 | නිමල් ජයසිරි මයා. | 500.00 |
| 11 | 02-0502 | පියවතී කඳනආරච්චි මිය. | 5,000.00 | 31 | 08-1472 | ශ්‍යාමා සමරධීර මෙය. | 500.00 |
| 12 | 14-2450 | ජේ.එස්. ගුනියන්ගොඩ | 5,000.00 | 32 | 19-3123 | ටී.වී.බී. සුරම්‍යලතා මිය. | 500.00 |
| 13 | 20-3308 | රසිකා හෙට්ටිහේවා මිය. | 5,000.00 | 33 | 17-2904 | ඒ.තෝමසේන මිය. | 500.00 |
| 14 | 12-2152 | චම්පිකා අල්විස් මෙය. | 5,000.00 | 34 | 11-2044 | කුසුම් දසනායක මිය. | 500.00 |
| 15 | 12-2153 | දයානි අල්විස් මිය. | 5,000.00 | 35 | 21-3390 | ජී.ජී. තිලකසිරි මයා. | 500.00 |
| 16 | 03-0686 | නිහාල් මෙන්ඩිස් ඇතුලු පිරිස | 3,736.00 | 36 | 16-2742 | කේ.ඩී.එන්. ප්‍රිතිකා මෙය. | 500.00 |
| 17 | 20-3255 | ලක්මිණී නාලිනී ජයරත්න මිය. | 3,000.00 | 37 | 11-1962 | එම්. චන්ද්‍රලතා මිය. | 250.00 |
| 18 | 19-3077 | වාසල සෙනෙවිරත්න මිය. | 3,000.00 | 38 | 20-3235 | යොහාන් රෂ්ඩීන් මයා. | 200.00 |
| 19 | 20-3217 | චානක ලියනවත්ත මයා. | 3,000.00 | 39 | 20-3271 | ටී.වී. කමලා මිය. | 50.00 |
| 20 | 04-0840 | ලුෂානී කොඩිතුවක්කු මිය. | 2,500.00 | | | එකතුව | 447,076.00 |

## 2011-02-06_මෙත්සවිය මෛත්‍රී භූෂණ උපහාර සම්මාන ප්‍රදානෝත්සවයේ විශේෂ අවස්ථා

මෙවර සම්මාන ප්‍රදානය කලේ පූජ්‍ය පාද විශ්ව කීර්ති ශ්‍රී ආචාර්ය බුද්ධගයාවේ සීසිල චන්ද්‍ර හිමිපාණන් සහ දේශමාන්‍ය කත්‍රි ආරච්චිගෙ දොන් නිහාල් විජේරත්න මහතා වෙතය.



## 2011 මාර්තු 06 ඉරු දින - සාර්ථකව ඉගෙනීම හා විභාග සමත් වීමේ නවීන ක්‍රමවේද වැඩමුළුව විශේෂ අවස්ථා

මෙම වැඩමුළුවට සහභාගි වූ සියලු දෙනාට කෙටි ආහාර සැපයූ සාමාජික රොහාන් සිල්වා මහතාට සහ කිරි පැකට් සැපයූ සරත් ඉලංගතිලක මහතාටත්, මෙම කාර්යයට නන් අයුරින් උදව් කල සියලු දෙනාටත්, සහභාගි වූ සියලු දෙනාටත් මෙත් සවිය ආශීර්වාදය.



2600 සම්මා සම්බුද්ධත්ව ජයන්තිය සමරනු වස් මෙත් සවිය මහියංගනය පුණ්‍ය භූමියේ ඉදිකරන ලද ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් පිරිසකට එකවර පෙරන ලද පිරිසිදු ජලය සැපයිය හැකි නවීන තාක්ෂණය පදනම්වූ අමෙරිකානු ජල ෆිල්ටර සහිත පානීය ජල ව්‍යාපෘතියේ අවස්ථා කිහිපයක්. මෙයට ආධාර මුදල් සැපයුබැතිමතුන් ගේ විස්තර සඳහා 6 පිට බලන්න.



**ගුරු පුද පැතුම්** සංජීවනී ප්‍රේමරත්න (සාමාජික අංක:22-3489)

මෙත් සවි අපේ ජීවිතයට සවි වේවා
අත් හල කෙලෙස් මග නිවනම පෑ දේවා
පින් කළ උතුමන්ම යන මග එළි වේවා
එන් දන මැතිඳුනට බුදු බව අත් වේවා

මතු සසරේදිත් ඉපදී ඔබ මිනිස් පුරේ
ලොව යහ මගට ගන්නට සිත කුසල් පිරේ
දරු සෙනෙහසට රතුවන් ලේ කිරට හැරේ
ඔබ වැනි පුතකු ලද මෑණිත් නිවන් පුරේ

## මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරයක් මෙත්සවියට සැපයූ වගයි

චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන පහසුවෙන් මෙහෙයවීම සඳහා රු.ලක්ෂයක පමණ වියදමින් නවීන මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරයක් මෙත්සවියට සැපයීමට දායක වූ සංජීව රත්නායක, අසංක රත්නායක සාමාජික දෙසොහොයුරන්ට හා දෙමාපියන්ටත් දීර්ඝායු හා නිරෝගී සම්පත්තිය ප්‍රාර්ථනා කර පින් අනුමෝදන් කරමු.

## රැහැන් රහිත මයික්‍රොපෝන පද්ධතියක් මෙත්සවිය ශබ්ද විකාශන යන්ත්‍රයට සැපයූ වගයි

චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් පහසුවෙන් මෙහෙයවීම සඳහා රු.ලක්ෂයක පමණ වියදමින් රැහැන් රහිත මයික්‍රොපෝන පද්ධතියක් මෙත්සවිය ශබ්ද විකාශන යන්ත්‍රයට සැපයීමට දායක වූයේ ලසන්ත පෙරේරා, චින්තන බණ්ඩාර, සංජීව රත්නායක, අසංක රත්නායක, මංජුල පත්ම කුමාර යන සාමාජිකයන්ය. මෙම කාර්යයට දායක වූ සාමාජිකයන්ටත් නන් අයුරින් උදව් කල සියලු දෙනාටත් පින් අනුමෝදන් කරමු.



# කරණීය මෙත්ත සූත්‍රය

(සූත්‍ර පිටකය, ඛුද්දක නිකාය, සුත්ත නිපාතය, උරග වග්ගය)

| | |
|---|---|
| කරණීය මත්ථ කුසලේන[2] | ඒ ශාන්ත පදය වන "අමා නිවන" ට පැමිණ වාසය කිරීමට |
| යං තං සන්තං පදං අභිසමෙච්ච[1] | කැමති අයෙකු විසින්[1] ඒ සඳහා ඇති කර ගත යුතු කුසලතා[2]; |
| සක්කෝ | (කුටි සෑදීම සිවුරු මැසීම පඬු පෙවීම පාත්තර සකස් කිරීම ආදී)සියළු කටයුතු වල දක්ෂයෙක් විය යුතුයි |
| උජු ච | ඍජු (අවංක) කෙනෙක් විය යුතුයි |
| සුජු ච | ඉතා අවංක කෙනෙක් විය යුතුයි |
| සුවචෝ චස්ස | කීකරු කෙනෙක් විය යුතුයි |
| මුදු | මෘදු හිතැත්තෙක් විය යුතුයි |
| අනතිමානී | අධික මාන නැත්තෙක් විය යුතුයි |
| සන්තුස්සකෝ ච | ලද දෙයින් සතුටු වන කෙනෙක් විය යුතුයි |
| සුභරෝ ච | පහසුවෙන් පෝෂණය කළ හැක්කෙක් විය යුතුයි |
| අප්පකිච්චෝ ච | අඩුවෙන් වැඩ කටයුතු ඇත්තෙක් විය යුතුයි |
| සල්ලහුකවුත්ති | සැහැල්ලු පැවතුම් ඇත්තෙක් විය යුතුයි |
| සන්තින්ද්‍රියෝ ච | දමනය කළ, සන්සුන් ඉඳුරන් ඇත්තෙක් විය යුතුයි |
| නිපකෝ ච | තැනට සුදුසු නුවණ ඇත්තෙක් විය යුතුයි |
| අප්පගබ්භෝ | හැඩිදැඩි අසංවරගති නැත්තෙක් විය යුතුයි |
| කුලේසු අනනුගිද්ධෝ | හිත මිත්‍ර කුල පවුල් වල නොඇලෙන්නෙක් විය යුතුයි |
| න ච ඛුද්දං සමාචරේ කිඤ්චි යේන | නුවණැත්තන් නින්දා කරන ඉතා සුළු වරදක් වත් නොකරන |
| විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං | අයෙක් විය යුතුයි. |

(මෛත්‍රිය වඩන ආකාරය)

| | |
|---|---|
| සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු | සියළු සත්වයෝ සුවපත් වෙත්වා භය නැත්තෝ වෙත්වා සැප |
| සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා | ඇති සිත් ඇත්තෝ වෙත්වා |
| යේ කේචි පාණභූතත්ථි[3] තසා වා[1] | කෙලෙස් සහිත වූ[1] ද, කෙලෙස් රහිත වූ ද[2], යම් සත්ව |
| ථාවරා වා[2] අනවසේසා[4] | පිරිසක් ඇද්ද[3] ඒ සියළුම දෙනා ද[4] |
| දීඝා වා යේ මහන්තා වා | දිග සත්තු ද මහත ශරීර ඇති සත්තු ද |
| මජ්ඣිමා රස්සකාණුකථූලා | මධ්‍යම ප්‍රමාණයේ සත්තු ද මිටි සත්තු ද ඉතා සියුම් සත්තු ද ස්ථූල සත්තු ද |
| දිට්ඨා වා යේව අද්දිට්ඨා | ඇසට පෙනෙන සත්වයෝ ද ඇසට නොපෙනෙන සත්වයෝ ද |
| යේ ච දූරේ වසන්ති අවිදූරේ | දුර වාසය කරන සත්වයෝ ද ළඟ වාසය කරන සත්වයෝ ද |
| භූතා වා සම්භවේසීවා | ඉපදී සිටින සත්වයෝ ද ඉපදෙමින් සිටින සත්වයෝ ද |
| සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා | සියළු සත්වයෝ සුවපත් වෙත්වා |
| න පරෝ පරං නිකුබ්බේථ | කිසිවෙක් කිසිවෙකුට (රැවටීම් ආදියෙන්) හිංසා නොකෙරේවා |
| නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි | කිසි තැනකදී කිසිවෙක් කිසිවෙකුට අවමන් නොකරත්වා |

(......12 පිටුවට)

| | |
|---|---|
| බ්‍යාරෝසනා පටිඝ සඤ්ඤා | නුරුස්නා ක්‍රියාවෙන් හෝ නපුරු සිතුවිල්ලෙන් හා වචනයෙන්, |
| නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය | ඔවුනොවුන්ට දුකක් කැමති නොවෙත්වා |
| මාතා යථා නියං පුත්තං | තම ජීවිතය මෙන් පුතු සුරකින |
| ආයුසා ඒකපුත්තමනුරක්ඛේ | එකම පුතෙකු ඇති මව් විලසින් |
| ඒවම්පි සබ්බභූතේසු | සියළු සත්ත්වයන් කෙරෙහි |
| මානසං භාවයේ අපරිමාණං | අප්‍රමාණ වූ මෙත් සිත පැතිර විය යුතුය |
| | |
| මෙත්තං ච සබ්බ ලෝකස්මිං$_7$ | උඩ දා$_1$ යට දා$_2$ හරහට දා$_3$ සීමාවක් නැතිව$_4$ වෛර සිත් |
| මානසං භාවයේ අපරිමාණං$_8$ | නැතිව$_5$ සතුරු බාධා නැතිව$_6$ සියළු ලෝකය කෙරෙහි$_7$ |
| උද්ධං$_1$ අධෝ ච$_2$ තිරියඤ්ච$_3$ | අප්‍රමාණ වූ$_8$ මෙත් සිත පැතිරිය යුතුය. |
| අසම්බාධ$_4$ අවේරං$_5$ අසපත්තං$_6$ | |
| | |
| තිට්ඨං චරං නිසින්නෝ වා | සිටගෙන සිටින විට ඇවිදින විට හෝ හිඳගෙන සිටින විට ද |
| සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ | නිදාගැනීමට ගිය විට හා නින්ද යන තුරු ද |
| ඒතං සතිං අධිට්ඨෙය්‍ය | මේ මෛත්‍රී සහගත සිත අධිෂ්ඨානයෙන් සිහි කළ යුතුය |
| බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු | එසේ විසීම බ්‍රහ්ම විහරණය යි කියනු ලැබේ. |
| | |
| දිට්ඨිං ච අනුපගම්ම සීලවා | (මෙසේ කරන තැනැත්තා) කිසිදු මිථ්‍යා දෘෂ්ඨියන් හි නොඇළී |
| | සිල් ගුණ ධර්ම දියුණු කරගෙන |
| දස්සනේන සම්පන්නෝ | සොතාපණ්ණ මාර්ගය දකිනා නුවණින් යුතුව |
| කාමේසු විනෙය්‍ය ගේධං | කාමයන් ට ඇති ඇල්ම දුරු කොට |
| නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතී ති. | නැවත මව් කුසක බැස ගැනීමට නොපැමිණේ (පිරිණිවන්පානු ලැබේ) |

## කර්මය නම්....

සාමාජික ලිපි

කර්මය නම් ස්වසන්තානයෙහි අතීතයෙහි උපන් කුසලාකුසල චේතනාවෝය. කර්ම නිමිති නම් කුසලාකුසල කර්මය කිරීමට උපකරණ වූ දාන වස්තු, බුදු පිළිම, චෛත්‍යය ආදිය හා කඩු, තුවක්කු, දඬු මුගුරු ආදියයි. ගති නිමිත්ත නම් තමා උපදින්නා වූ ස්ථානයේ තිබෙන යම් කිසි දෙයකි. එය වැටහෙන කල්හි දෙව් ලොව උපදින සත්වයන්ට දිව්‍ය විමාන, දිව්‍ය රථ, දිව්‍ය උද්‍යාන, කල්ප වෘක්ෂ ආදියද; මිනිස් ලොව උපදින අයට මාතෘ ගර්භද; නරකයෙහි උපදින්නන්ට නිරය, ගිනි, යමපල්ලන්ද; ප්‍රේත හා තිරිසන් යෝනිවල උපදින සත්වයන්ට පර්වත ආරණ්‍ය ආදියද ගති නිමිත්ත වශයෙන් වැටහේ. මෙසේ වැටහීමෙන් අතීතයේ කරන ලද පූර්ව කර්ම වැටහේ. මෙසේ අතීතයේ පුරාණ කර්ම අලුත් වේ. මෙය ඇතැමෙකුට මරණයට ඉතාමත් ආසන්නවද, තවත් අයෙකුට මරණයට පැය ගණනකට හෝ දවසකට දෙකකට පෙරදා හෝ පූර්වයෙහි වැටහේ. කිණිහිර පිට තබා මිටියෙන් තලන ලද මැස්සා වුවත් මේ තුනෙන් එකක් වැටහීමෙන් පසුවම මරණයට පත්වේ.

එක රූපයකට ඇත්තාවූ ආයුෂය චිත්තක්ෂණ සතළොසකි හෙවත් සිත මෙන් සතළොස් ගුණයකි. එබැවින් ඔහුගේ සන්තානයෙහි අන්තිමයෙහි උපන් හෘදයවස්තු රූපය ඇසුරු කොට සිත් සතළොසක් උපදියි. ඉන්පසු ඔහුගේ සන්තානයෙහි අන්තිමයෙහි උපන් සිතට නිශ්‍රයවීමට වස්තුවක් නැති බැවින් සිත් පහල නොවෙයි. එවිට සත්වයා මරණයට පත්වූවා යයි කියනු ලැබේ.

පංචස්කන්ධය නිතරම පෙලෙන්නේ දුකිනි. අභ්‍යන්තරයේ සිට ඉතා දරුණු අන්දමින් රිදවන්නේ රාගාදි ක්ලේශ යෝය. මේ නිසා ඇතමුන්ගේ ශරීරය දිරාපත් වේ. දිවි නසා ගැනේ. මේ දුබල ජීවිතයත් සමග අනවරාග්‍ර සංසාරයෙහි සැරි සරන සත්වයෙකුට අතීතයේ සිට පැමිණිය හැකි මරණවල ප්‍රමාණයක් නැත. මෙය තේරුම් ගෙන එහි ඇලී නොසිට නුවණැත්තෝ මරණය වලක්වා ගැනීමට නිවනට යොමු වෙත්වා. එඩ්වඩ් සමරදිවාකර (සාමාජික අංක:01-0109)

## ලිපි සහ නොමිලයේ පලකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

වැදගත්

මෙත්සවිය පුවත් සඟරාවේ පළ කිරීම සඳහා එවන සියලු ලිපිද, දාන-ශීල-භාවනා වැඩසටහන් වලදී දායකත්වය දරන පිංවතුන්ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන්ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාර දිය යුතුය. සාමාජිකයන්ගේ දැන්වීම් නොමිළයේ පළ කරනු ලැබේ. කොළ කැබැලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථානගත විය හැකි බැවින් ඒ පිළිබඳ වග කියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේද වම් පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තිබිය යුතුය.

සංස්කාරක

## මෙත් සවිය දුරකතන අංක

මෙත්සවිය වැඩසටහන්/තොරතුරු දැනගැනීමට www.methsaviya.lk සහ www.methsaviya.org වෙබ් අඩවි භාවිතා කරන්න.

මෙත්සවිය තොරතුරු විමසීමට පරිපාලන නිලධාරී මහතා අමතන්න (011-2505088/ 071-4014467). එම දුරකතන වල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

මීට අමතරව සම ලේකම් වරුන් වන තුසිත දොඹගොඩ (071-4454411) හා පී. සූරිය ආරච්චි (071-2774727) යන මහතුන්ගේ පුද්ගලික දුරකථන අංකයන් අමතා හදිසි තොරතුරු ලබා ගත හැකිය.

සංසදයේ සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම දුරකතන අංක (071-4800800) හෝ (0777309385) මගින් දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00-10.00 ත් අතර පමණක් (ඉතා හදිසි අවශ්‍යතාවයකදී ඕනෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකතන පණිවිඩ 30ක් පමණ ලැබෙන නිසා සාමාජික අංකය හා නම පවසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදු කරන්නේ නම් මැනවි.)

## නොමිලයේ රෝද පුටු සහ කිහිලි කරු ලබා දීම්

මෙත්සවිය මගින් අසරණ අය සඳහා රෝද පුටු සහ කිහිලි කරු පරිත්‍යාග කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කර ඇත. රෝද පුටු හෝ කිහිලිකරු අවශ්‍ය අය වෙත් නම් මෙත් සවිය වෙත ලිඛිතව ඉල්ලීමක් සිදු කළ යුතුයි. මෙම වැඩ සටහන සඳහා රෝද පුටු සහ කිහිලි කරු ලබාදී දායක වීමට කැමති පින්වතුන් හට එම උපකරණ මෙත් සවිය වෙත ලැබෙන්නට සලස්වන ලෙස මෙත් සිත් පෙර දැරිව ඉල්ලා සිටිමු.

## මරණයෙන් නිදහස් කරගත් ගවයින්ට ආහාර

වැල්ලවත්තේ විජයාරාමාධිපති පූජ්‍ය අහංගම ආනන්ද නාහිමිපාණන් මරණයෙන් නිදහස් කරගත් ගවයින් රැකබලා ගැනීමට කෙනෙකුට බාරදෙන තෙක් බණ මඩුව පිටුපස රඳවා ඇත. මේ ගවයින්ට ආහාර දීම සඳහා තණ මිටියක් ගැනීමට දායකවී කුසල් රැස් කර ගන්න. තණ මිටියක් රු.35. දිනකට ගවයකුට ආහාර දීමට තණ මිටි 2ක් අවශ්‍ය වේ.

## මෙත් සවිය පුස්තකාල පොත් හා සීඩී තැටි

ඔබ විසින් පුස්තකාලයෙන් ලබාගත් මාසයක් ඉක්මවූ පොත් හා සී ඩී තැටි කරුණාකර කාර්යාලය වෙත භාර දෙන්න.

පුස්තකාල පොත් හා සී ඩී තැටි සඳුදා අඟහරුවාදා හැර කාර්යාලය විවෘතව ඇති සතියේ අන් දිනවලදී සාමාජික ඔබහට ලබාගත හැක. පන්ති පැවැත්වෙන ඉරිදා දිනවලදී පමණක් පුස්තකාල පොත් ලබා ගැනීම සඳහා ප.ව 1.45 ට පෙර පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමු.


## ඡායාරූප

සම්බන්ධ ඕනෑම කටයුත්තක්

කලාත්මකව කර ගැනීම සඳහා

මෙත්සවිය සාමාජික එස්. පී. පියරත්න

071-327 3858



## සයිට්-ඇන්-ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්

SIGHT-N-STYLE OPTPMETRISTS

අංක: 126 ඩී, හයිලෙවල් පාර, නුගේගොඩ.

(අනුලා විදුහල ඉදිරිපිට)

දුරකතන: 011-2854758

සියලුම වර්ගයේ ඇස් කන්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න

මෙත් සවිය සාමාජිකා නෙරංජලා කන්නන්ගර මහත්මිය



## වාස්තු විද්‍යානුකූල නිවාස යක් සඳහා

**Home Sweet Home Designs**

161, Kandavihara Road Kaluwamodara
Aluthgama Sri Lanka.
034-2275228


ප්‍රායෝගික අධිමානසික විද්‍යාව හා පංච අභිඥා පිළිබඳ දැනුවත් කිරීමේ 20 වන වැඩසටහන

**2012 01 15** වන දින පෙව **10** ට අරඹනු ලබන අතර ඒ සඳහා අයදුම් පත් **2012 01 08** වන දිනට පෙර බාරදෙන්න.

ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අයට මූලිකත්වය ලබා දේ.

# මෙත් සවිය මෛත්‍රී සංසදය සාමාජික අයදුම්පත

(ඡායා පිටපත්ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)

1. සම්පූර්ණ නම ..........................................................................................................................

2. ස්ත්‍රී / පුරුෂ භාවය............. 3. ජාතික හැඳුනුම්පත් අංකය......................................(ජාතික හැඳුනුම්පත් ඡායා පිටපතක් අමුණන්න)

4. උපන් දිනය ........................ 5. වයස.................. 6. ආගම.................................................................

7. ස්ථිර ලිපිනය.................................................................................................................................

.......................................................................................................................................................

විද්‍යුත් තැපෑල(e-mail)............................................ දුරකථන අංක-නිවස-........................ ජංගම.......................

8. දිස්ත්‍රික්කය............................................ 9. විවාහක / අවිවාහක බව..................................................

10.රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර........................................................................................

(ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ........................................................................................

11. කාර්යාලීය ලිපිනය හා දුරකථන විස්තර..........................................................................................

12. ලිපි එවිය යුතු ලිපිනය........................................................................................................................

13. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්

1.................................................................................................................................

2.................................................................................................................................

14. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිලිබඳ විස්තර

1 .................................................................................................................................

2 .................................................................................................................................

3 .................................................................................................................................

15. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇඳුම,හෘද රෝග,දියවැඩියාව,රුධිර පීඩනය,අපස්මාරය ) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර

.......................................................................................................................................................

16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද? ඔව්/නැත.

17. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර . .

.......................................................................................................................................................

18. ඔබ විසින් සඳහන් කළයුතු මෙහිදී වැදගත්යැයි හැගෙන වෙනත් විස්තර හෝ යෝජනා /අදහස් තිබේනම් මෙහි සඳහන් කරන්න ..........................................................................................................................

.......................................................................................................................................................

මම දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මම පිළිගනිමි.

දිනය.....................  අයදුම්කරුගේ අත්සන..................................

## කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය..................................

..................................  ..................................

තේරීම් කමිටු සභාපති  විධායක ලේකම්

දිනය.................

සැ.යු. ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණ/වැඩමුළු/මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශණ ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම, හැඳුනුම්පත් සැපයීම, තැපල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිලධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු.1500/-ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය.(එය ඇතුළත්වීමේ ගාස්තුව රු.500/-හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500/-×2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදයම් ලබන පවුල්වල අය තම ආදයම් තහවුරුකළ හැකි ලිපි ලේඛන (උදා:- තම විහාරස්ථානයේ නායක ස්වාමින්වහන්සේගේ නිර්දේශය,) සහිත ග්‍රාම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ.) කාර්යාලය සදුද, අගහරුවාද හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාද, ඉරිද ද ඇතුලුව සතියේ දින 5ක් විවෘතව පවති. අයදුම් කරන සෑමකෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍ය නම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 9×4 ප්‍රමාණයේ තම ලිපිනය ලියූ මුද්දර කවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් පමණක් යොමු කරන්න. (අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ)

ලිපිනය-ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 6. දුරකථන 011-2505088, 0714-014467

**2011 අප්‍රේල් 03 ඉරු දින - ත්‍රෛමාසික දාන ශීල භාවනා වැඩසටහන කලපලුවාව ආරණ්‍ය සේනාසනයේදී පැවැත්වූ වගයි**

කලපලුවාව ආරණ්‍ය සේනාසනයේ හීල් දානය සඳහා මෙත් සවිය කාන්තා කමිටුව රු. 6000.00 මුදලක්ද මෙත් සවිය සාමාජික-සාමාජිකාවන් රු. 11350.00 මුදලක්ද පූජා කරන ලදී. දායකවූ සාමාජික-සාමාජිකාවන්ටත්, මෙයට නන් අයුරින් උදව් කල සියලු දෙනාටත්, සහභාගි වූ සියලු දෙනාටත් පින් අනුමෝදන් කරමු.



**මෙත් සවිය ආරම්භ කල මිරිසවැටිය සලපතල මලුවේ ගල් ඇතිරීම 2011 ජූලි 25 දා මුලුමනින් නිම කල වගයි.**

දායකවූ සාමාජික-සාමාජිකාවන්ටත්, මෙම කාර්යයට නන් අයුරින් උදව් කල සියලු දෙනාටත්, සහභාගි වූ සියලු දෙනාටත් පින් අනුමෝදන් කරමු.



**2011 ඔක්තෝබර් 02 ත්‍රෛමාසික දාන ශීල භාවනා වැඩසටහන අලුත්ගම කලුවාමෝදර කාලවිල වත්තේ මුහුද මැද පිහිටි පංචකපදුපතේ ධර්මද්වීප යෝගාශ්‍රමයේදී පැවැත්වූ වගයි**




ධර්මද්වීප යෝගාශ්‍රමයේ දාන ශාලාවේ වහලය සම්පූර්ණයෙන් අළුත්වැඩියා කිරීමට රු. 84,000.00 මුදලක් මෙත් සවිය සාමාජික -සාමාජිකාවන් පූජා කරන ලදී. දායකවූ සාමාජික-සාමාජිකාවන්ටත්, එහි සියලු කටයුතු සංවිධානයට මූලික වී ක්‍රියා කල සාමාජික කුමාර මහතාට, එම මැතිණියට සහ පවුලේ අයටත්, මෙම කාර්යයට නන් අයුරින් උදව් කල සියලු දෙනාටත්, සහභාගි වූ සියලු දෙනාටත් පින් අනුමෝදන් කරමු.